නිර්මාණ අඩවිය

පහන් වැට ට ලියන්න. සන්නස පහන් වැට කාව්‍ය නිර්මාණ විශේෂාංගයට ලැබෙන කවි අතරින් එක් කවියකට වටිනා සීඩීඩී තැටියක් පිරිනැමීමට ඔස්ට්‍රේලියාව පුරා විජය ප්‍රොඩක්ට්ස් බෙදාහරින DBSJ එන්ටප්‍රයිස් සූදානම්

DBSJ Enterprise Tel/Fax 03 8336 1113

ජූලි මාසයේ පහන් තරුවට කවි ලියා මෙල්බන් හි DBSJ Enterprise වෙතින් DVD තැටියක් ලබන්නට වරම් ලද කවියා

විජයසිරි තිලකුමාර

ගංදෑලේ ගිය සිහිනේ ..

මාළ ගිරවි සින්දු කිව්ව
මේ වැඩි ඉස්මත්තේ
තාලයකට අත් අල්ලා
රැ ඉතුවෙමු අපි පින්නේ ..
සාරී පොටක මුතු වාගේ
කඳුළැල්ලක් රැඳුණේ
පාරමිතා පිරූ සිහිනෙම
බිඳිලා ගියපු දවසේ ..
කාට කියන්නද මගේ දුක
රැඳුණා හද පතුළේ
කාළ වළවට දැණුනා
නෙතු යුග පෙළු කඳුළු
පාට පාට මල් අමුනා
ගෙන්තමි කළ මාලේ
ජේන දුරක මං සිරිදාදි
ගියාළෝ ගං දෑළේ ..

ධම්මි වීජේසිංහ කැනඩාව.

අම්බලෙමිදි

අඩක් දිවියෙන් ගත වෙලා
සිතත් වෙගෙසට පත්වෙලා
ගෙවක් එන තුරු සැපෙන් සිරුරු
කොහෙක් ඉන්නද ඉවසලා

පතොක් කුටු පිරි පිළිතේ
ගෙවක් ආ මග රකලවරේ
කොහෙක් බිම් මල් පිපී තිබුනද
තෙතක් සිසිලක් එහි නැතේ

දවස් එක දෙක එකතු වී
තවත් විසරක් යයි ගෙවී
ලදොත් සතුටක් එක දිනක වත්
දහස් සැරයක් හිනැගමි

රසිකා පෙරේරා

ලක්ෂ්මන් කදිරගාමර් උපහාර !

දුරලම් බේද දෑ ආගමි ඇති සැවොම
සිතනෙමි නිතර කළ හැකි සෙ'වය ගැනම
පරදමි සියලු බල වීන කරීනා මෙ බීම
සමරමි සදා ගරු මැතියුන' කදිරගම

හිමා වෙන'ට පෙර කාවීය පිළිගැණුනු
දමා ගියා මව් රට කළුළින' පිරුණු
මිතිකත නූහුලන අපරාධෙට දරුණු
ගඟනව උන'ට නිසැකයි වැහි නැති අඹුණු

බිය කරු නිගරු දෑ වාදය පිටු පෑවා
සැම ලක' සුතන වෙත එක සෙනෙහස පෑවා
පෙරමුණ ගෙන දසත ආදුරුසය වූවා
නොතියව රදුරු වෙඩි උන'ඩෙට ළය පාවා

බියගුළු නිවටයින' තැති ගෙන පැන දුවන
අවදානම් මගෙහි ඇති තතු දැන සොඳින
යුතුකම අරුත දිවීයෙ' නිසි හැඳින ගෙන
නැගු සක' හඬෙන'මයි බල බීළුනෙ' රුපුන

තම බඩ වඩා ගැනුමට පමණක' සිතන
දෙස'පාලුවො' කොතෙකුත' ඇති මේ දෙරණ
තම දිවි පවා නොතකා අවි ලෙලවමින
ඔබ පෑ විකුම් කදිමයි පාඩම් ගන'න

සිත' පිත' නැති තුස'තවාදය මැඩලන'න
පැතිරූ ලොව පුරා බේගල' බීඳලන'න
දැරුවො වෙහෙස ලක' මව බේරා ගන'න
මල' පිබීදුණා යන මග ඔබ සිප ගන'න

සපුරා ගන'න දැල'වූ අදිටන දිරිය
ගිලිහෙන'නට නොදෙමු ඔබ එසවූ අවිය
යා යුතු නියම මග පෙන'වා පෑ එඩිය
ඔබ කල සෙ'වයට ලක'දන ණය ගැතිය

ප්‍රකාශ් වැල්හේන,
කැන්බරා

අබිසරු ලියකගේ ගීතය

සමාවනු නැගණියනි මා
ඔබේ පිය සබඳ විහිවිද වූ
සළුපිළින් සුවඳ වීලුවුන්
මතින් සොරා ගත්තේ
නොවෙමි

යාන වාහන තවත් නේක
සම්පත් ඇතත් හිස්
ලෙනකි සිත් මැදුර පුරනු
වස් ඒ අඩුව යදී ඔහු මා
සෙනේ මේ දිළිඳු
පැල්පතේ නොමැතත අඹු
සැමි වාද නැඳි මයිළණුන්
බේද සවන් දොර
ඇසෙන්නේ පිය තෙපුල්
පමණකිය

විඩා පත් ඔහු සිතද
පතන්නේ එපමණිය මේ
කුඩා කුවුළුවෙන් හිස
පොවන දනනතුර එක්
අයෙකු පමණි ඔහු අස්
වැසිල්ලක් පතා පැමිණි
සඳ උන් මවෙත පුදමි මම
ආදරය

ශ්‍රියා කුමාරසිංහ
නවසීලන්තය

වේදනා

දිනකදි අතීතයෙ ගෙවූ අප තරුණ වියේ
සම්මත යදම මගෙ දෙපතුල බැඳලයේ
හැරදා ගියෙමි ඔබ තනිකර දිනක පියේ
එනමුත් රැඳී ඇත ඔබ රුව අදද ලයේ

මව් පිය උරුම කර දුන් මගෙ දිවිමඟට
සෙනෙහස සමග සිතුවෙමි කල් ගෙවන්නට
ගෙට ගැන සිතා නැඟුවොත් පිය පෙර මඟට
හද වැළපුනේ ඔබගෙන් ලද සෙනෙහසට.

ඔබ එකතැනක සම්මතයේ බැමි බැඳිලා
මම තව තැනක වැලපෙමි ඔබ ගැන සිතලා
ලං විය නොහැක අප දෙතැනක තනිවිලා
එනමුත් දනිමි අපෙ හදවත් එක්වීලා.

ඔබ ගොඑලුනත් තෙරපා ඔබ හැඟුමි හැම
මිහිරිය ඔබෙන් මම දිනනකදි ඉබපු පෙම
සුන්කල හැකිද සෙනෙහස ඔබ නැගෙන ලෑම
ඔබ ආදරය හිමි මට බව දනිමි මම,

විජයසිරි තිලකුමාර

'මව් බිමෙ නැහැන්ඩිට....

තරුපති නැගීගෙන එන නුඹ තලාවේ
මඳ මඳ සිනාසෙයි අතරීන් වලාවේ
ඔබ ගැන සිතන විට මට මේ වෙලාවේ
පාළුව අඳුර දුරුවෙයි හුදකලාවේ

සතිඅග නිවාඩුව හිමි වන තුරුම බලා
අපෙ හිතවතුන් පිරිසක් හා එකතු වෙලා
හිම කැට පිරුණු" මැසිඩන්" කඳු මුදුන බලා
සතුටින් ගියෙමු සිටියෙමු කඳු මතට වෙලා

සිහිජය වසා පැතිරෙන වා තලය මත
හිරු රැ ස් ඊදි රේකා ලඹණකුදු නැත
මව් බිම තරම් ගත සිත සනසවන නෙත
උණුසුම සිසිල මේ හිම කඳු අතර නැත

අදිවේගයෙන් යන ඊට වාහන නඩය
කොම්පියුටරයකින් එයි ගෙදරට දඩය
ගිය ඊට තැපැල් හලකට එහි පොඩි ඉඩය
ලක්දිව ආමතිවරයෙකු නොකරන වැඩය

හැම උදයකම ගොස් කොම්පියුටරය වෙත
යොමුකර පුවත්පත් තොරතුරු වලට නෙත
විමසා බලන ඊට රට තොට හතර අත
මෙල්බන් පුරට මගෙ මව්බිම දුරද නැත

විදහනු පිණිස බුදු කරුණා සිසිල් ගුනේ
කැප කළ කලාකරුවා සිය ඊසල් ගුනේ
ගී රස සැඳෑවට ගායක දිවුල්ගනේ
"සන්හිඳ" පා මුලට කවිරුත් තුරුල් වුනේ

අප හිතවතා මද්දුම සහ පරිවාර
නළු කැළ ඉදිරිපත් වී කළ මනහාර
නෙත් යුග පුරා ලැබ මහිමය පින්සාර
රඟ දැක්වුණා ළඟ දිනකදි " මහසාර"

එගොඩහ ගොඩෙහි ඉඳ නොපෙනෙන දිහාවක
සුපුරුදු පරිදි පැටලී රස කතාවක
තොරතුරු රැ ගෙන එන සුම්පුරු ලතාවක
පිළිසඳරකදි හමුවෙමු යළි වතාවක

හිම බිමේ අයියන්ඩිට...

සෙනෙහස සතුට ගෙනවන ඔබෙ සුවඳ රැ දී
රස ඉතිරුනා කියවන විට මිහිරි පැදී
අමතන විටදි ඔබ එතෙරින් මෙතෙර බැඳී
ගතසිත මිහිරි වී සුපුරුදු රසය විඳී

නැන්දා පැමිණ නිවසට ළඟකදි දිනෙක
අම්මත් සමග හිඳගෙන සාලෙහි කොනක
කල කී කතාවක් දැවටුනි මගෙ කනක
"හඳහන් බලනවලු කවිදෝ හොඳ තැනක

අප වැනි කාන්තා පරපුර ගැනම සිතා
පළකළ ලිපිය අප මීමන කිව්දු පුතා
ගියවර සන්නසෙහි වීය හරබරව ඉතා
අප සිසු පිරිස ඒ පිළිබඳ කරති කතා

සැණකෙලි සමය ඇරඹෙන ලද ඇසල මහේ
වෙහෙරෙහි නැටුම් බෙර පද හඬ තවම ඇහේ
අයියත් හිටියනම් තනි නොතනියට මෙහේ
පෙරහැර පොළට යමි හැම දවසකම පහේ

තරඟෙට වගේ කොයි කාගෙත් දේසනය
කවිරුත් එකයි බව පවසන දුසනය
සූනාමියට වැඩියෙන් කළ පීඩනය
මිලියන ගනන් මුදලට නැති පාලනය

ජනබල මෙහෙයුමට ගිය තම හිත ඇද්දී
රසකර කියයි අප්පච්චත් දුටු සිද්දී
ලොකු අයියාට නම් එය ගැන පවසද්දී
හෙම්හිට ගියා එතැනින් හෙම්හිට ඇද්දී

අප මවුබිමට බඹදත් ආදරය ඇති
බැබලුනු විදෙස් ඇමතිදු නැසෙ පහන තිති
බිහිසුනු රදුරු කොට පෙනුනා වියරු ගති
බඳ හඳ අගුරු තව විපතක ලකුණු වෙති

සුළඟට බීළුණු ඔරුවක් මෙන් වැනෙන ඔහේ
නොදැනිති කිසිවකුදු හෝ මේ යනුද කොහේ
හිතිය රකින ලද නිලදරුවනගෙ මෙහේ
පළඳති ආමති පුතුවරු කටු ඔටුණු ඉහේ

මී මැසි බමර කැළ දෙන ඉම්හිරී සද්දෙන්
සුවඳැති කුසුම් පෙති එකවක පිබීදෙද්දෙන්
එතෙරින් මෙතෙර අමතන අසිරිය මැද්දෙන්
සෙනෙහස සතුට හෙව යළි ගෙට ගොඩ වෙද්දෙන්

ජගත් වෙත්තසිංහ

ධම්මපදය ඉතා අගනා හස්තසාර ග්‍රන්ථයකි. ක්‍රිස්තු භක්තිකයනට බයිබලය ද, ඉස්ලාම් ඊක්තිකයනට කුරානය ද, බිත්දු භක්තිකයනට භගවත් ගීතාව ද මෙන්ම බෞද්ධයනට ත්‍රිපිටකය අගනා ග්‍රන්ථ රත්නයකි. එහි එක් කාණ්ඩයක් වන තුදුගත් සර්ගයට අයත් දෙවන පොත ධම්ම පදය යි. මෙහි වර්ග 26 ක් වන අතර ගාථා 423 ක් ඇතුළත්වී ඇත. ධම්මපදය ඉගෙනීම, එය පිළිපැදීමට උත්සාහ කිරීම බොදු මගෙහි තමන් කිරීමක් වන අතර බුදු දහම මෙනැවින් ඉගෙනීමක් ද වන්නේ ය. පෙර අපර දෙදිග බොහෝ භාෂා රණනකට පරිවර්තනය වී ඇති ධම්ම පදය ලෝ පුරා බොහෝ විද්වතුන් අසුරු කරන ග්‍රන්ථයකි.

ධම්ම පදයේ එන සෑම ගාථාවකින් ම කියා දෙන්නේ මෙලොව පරලොව දෙකෙහිම සුව ගෙන දෙන කරුණු ය. බුදු ගිම්යන් විසින් සත්වයගේ හිත සුව පිණිස දේශනා කර ඇති සියළු ධර්ම කරුණු ධම්මපදයේ කෙටි කර දක්වා ඇත. එම වටිනා ග්‍රන්ථ රත්නයේ ගාථා මෙසේ සන්නස සුවත් පතෙහි පළ කිරීම පින් සිදු වන ක්‍රියාවක් වන අතර බොහෝ අයගේ හිත සුව පිණිස විම සතුටට කරුණාකි.

යමක වග්ග

1 දුක පව් කළහු කරා පැමිණෙයි

මනෝ පුබ්බං ගමා ධම්මා
මනෝ සෙට්ඨා මනෝමයා
මනසාවේ පදුට්ඨේන
භාසතී වා කාරෝති වා
තතෝන දුක්ඛමන්වේති
චක්කං ව වහතෝ පදං

සියලු දහම් විඳිම්, හැඳිගිම්, රැස් කිරීම
සිත පෙරටුව එයි. සිතින්ම සිදු වෙයි
කියන්නේ නම් යමක් පව්වු සිතිකින්
කරන්නේ නම් යමක් පව්වු සිතකින්
දුකමයි ඔහු පසු පස එන්නේ
ගැලක බැඳි ගොනු අනුව යන ගැල් සක සේ

YAMAKA WAGGA

Manopubbangama dhamma
Manosetta manomaya
Manasa ce paduttena
Bhasati va karoti va
Tathonam dukkha manveti
Chakkan va vahato padam

Mind is the forerunner of states. Mind is chief, mind made one they. If one speaks or act with wicked mind, because of that, suffering follows one even as the wheel follows the hoof of the draught-ox.

නිදාන කතාව

සැවැත් නුවර පාලිත නම් එක් කෙළෙඹියෙක් (පවුල්කාරයෙක්) විය. බුදු ගිම්යන් වැඳීමට දෙවිරම් වෙහෙරට යන උවැසි උවැසියන් දැක පහන් සිතින් ඔවුන් සමග දෙවිරම් වෙහෙරට පැමිණියේ ය. එහිදි දහම් අසා සැදැහැ සිත දියුණු වූ අතර සසර පිළිබඳ දුකද අවබෝධ කරගෙන ඔහු සතු සියළු දේ පවරා දී පහන් සිතින්ම පැවිදි විය. වයස්තනව පැවිදි වූ හෙයින් රහත් බව ලබා ගැනීමට බොහෝ වෙහෙසව විදසුන් වැඩූ අතර නිදි වැරීම නිසාම ඇස් රෝගයකින් බලවත් සේ පෙළුණේ ය. ඇස් රෝගය ගැන තැකීමක් නොකොට වෙදැදුරන්ගේ උපදෙස්ද නොතකා භාවනා කටයුතු වල සිත පිහිටුවා රහත් බව ලබා ගත්හ. රහත් ඵලයට පැමිණීමත් ඇස් අඳ වීමත් එක වරම සිදු විය. උන් වහන්සේ වක්බුපාල නම් වූ හ. මෙසේ ඇස් අන්ධ වීමට හේතු වූ අතීත සිදුවීම ගෙවත් අතීත කතාව මෙසේ ය.

පෙර අත් බවෙක මේ තෙරණුවෝ දක්ෂ ඇස් වෙදැදුරෙක් වූහ. දැඩි ඇස් රෝගයකින් පෙළෙන ගැහැනියක් මේ වෙදැදුරු ගෙන් වෙදකම ගන්නීය. ලෙඩේ සුව වූ පසු වෙදැදුරුට කිසිවක් නොදීමේ සිතින් ලෙඩේ සුව නොවූ බව පවසා වෙදැදුරු රැවටීය. ගැහැනියක් විත් කළ රැවටීම වෙදැදුරුට දැනුණේ ය. කිළිටි සිතකින් වැඩි සුවය පිණිස යයි කියා විෂ යෙදූ බෙහෙතක් ගල්වා ගැහැනියගේ දෙඇස් යළිත් අඳ කළේ ය. මේ අවසන් අත් බව වුවත් රහත් බව ලැබුවත් ඒ කිළිටි සිතින් කළ පාපයේ විපාකය පල දුනි. ඒ රිය සක, රිය බැඳි ගොනුගේ පසුපස එන්නා සේ ය.